**කටුනායක සීදූව නගර සභාව - 2022**

**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කටුනායක සීදූව නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය , මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කටුනායක සීදූව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6 ඡේදයේ 1.6.2 (ඉ) නිරීක්ෂණ හැර, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිතිය උදෙසා වන විස්තරාත්මක පහදාදීම්වල ඇතුලත් EG 3.1 ඡේදය ප්‍රකාර කෙරීගෙන යන යම් ප්‍රාග්ධන වැඩ වෙතොත් ඒවා දේපළ පිරියත සහ උපකරණ යටතේ නොනිමි වැඩ නමින් වෙනම ප්‍රභේදයක් ලෙස පෙන්වනු වෙනුවට රු116,469,612 .ක් වූ නොනිමි වැඩ දිගුකාලීන ලැබිය යුතු දෑ යටතේ දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ සිට දැක්වීමට කටයුතු කරන බව. | ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතුය. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ ) | නගර සභාව සතු මුද්‍රණ යන්ත්‍ර 13 ක වටිනාකම වූ රු.503,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල යන්ත්‍ර ක්ෂය වටිනාකම රු.2,540,878 ක් විය යුතු වුවත් රු.2,527,378 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා රු.13,500 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ කාර්යාලීය උපකරණ වටිනාකම රු.1,656,086 ක් වැඩියෙන් හා ලී බඩු උපකරණ වටිනාකම රු.1,656,086 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | 2021 ජනවාරි 01 දිනට නොනිමි වැඩ යටතේ හා ණයහිමි යටතේ ගිණුම්ගත කර තිබුණු සමාලෝචිත වර්ෂය තුළ වැඩ අවසන් කර ගෙවීම් කරන ලද කර්මාන්ත 3කට අදාල රු1,860,278 ක් ගැළපීම් නොකිරීම නිසා නොනිමි වැඩ ගිණුම හා ණයහිමි ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | ලියනගේමුල්ල සංවර්ධන මාවත ප්‍රජාශාලාව රු.8,000,000 ක් තක්සේරු කර ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබියදී 2020 වර්ෂයේදී එම ගොඩනැගිල්ලේ පළමු මහලේ ඇස්තමේන්තු වටිනාකම වූ රු.1,961,949 ක් නොනිමි වැඩ යටතේ හා ණයහිමි යටතේ ගිණුම්ගත කර තිබීම නිවැරදි කර නොතිබීම නිසා නොනිමි වැඩ ගිණුම හා ණයහිමි ගිණුම එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබූ කුරණ කටුනායක සමගි මාවත ඉඩමෙහි වටිනාකම රු. 12,376,472ක් වුවත් ස්ථාවර වත්කම් උපලේඛනයේ රු. 12,473,722ක් ලෙස දක්වා තිබුණෙන් රු.97,250ක වෙනසක් විය. | ස්ථාවර වත්කම් උපලේඛනය හා ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදි කර ඉදිරි වර්ෂයේදී ඉදිරිපත් කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් හෝ උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නගර සභාවේ මුළු වියදම ඉක්මවූ ආදායම රු.177,782,346 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මුළු වියදම ඉක්ම වූ ආදායම රු.193,042,302 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට සාරාංශ මුදල් පොත අනුව බැංකුවේ ඇති මුදල් ශේෂය රු. 19,257,107ක් විය යුතු වුවද මූල්‍ය ප්‍රකාශවල එය රු. 19,272,588ක් ලෙස දැක්වීමෙන් රු. 15,401ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීම් ඉදිරි වර්ෂය තුළදී සිදු කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| .......... | .............. | .......... | ........... | ........... | ................. | ........... | .......... | ........... |
| | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' |
| (i)වරිපනම් හා බදු | 153,675 | 156,364 | 149,987 | 56,245 | 152,565 | 153,032 | 131,048 | 49,868 |
| (ii)කුලී | 8,550 | 11,939 | 12,031 | 882 | 9,600 | 11,072 | 8,425 | 6,176 |
| (iii)බලපත්‍ර ගාස්තු | 5,321 | 4,965 | 4,965 | - | 5,001 | 3,163 | 3,163 | - |
| (iv)වෙනත් ආදායම් | 118,025 | 133,233 | 129,081 | 18763 | 110,583 | 94,701 | 95,669 | 17,094 |
| | ----------- | --------- | ----------- | ------------ | ------------ | ---------- | ---------- | -------- |
| | 285,571 | 306,501 | 296,064 | 75,890 | 277,749 | 261,968 | 238,305 | 73,138 |
| | ======== | ===== | ====== | ====== | ======= | ===== | ===== | ===== |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට ඒකකයකින් අයවිය යුතු වරිපනම් වටිනාකම රු.50,000 ඉක්මවූ ඒකක 95කින් රු. 12,776,830ක් අයවිය යුතුව පැවතුණි. | හිඟ අය කර ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව. | පනතේ විධිවිධාන අනුව හිඟ අයකරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කර්මාන්ත බදු /ව්‍යාපාර බදු /වෙළඳ බලපත්‍ර 2022 සමීක්ෂණ වාර්තාවට අනුව ව්‍යාපාර ඒකක 1282ක් වාර්තා කර තිබුණද 2022ඔක්තෝබර් 06දිනට ව්‍යාපාර ඒකක 969කට අදාලව රු 969,000.ක බිල් කිරීම් කර නොතිබුණි. | ඒකක 810ක් සඳහා බිල්කර අදාළ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර ඇති බව. | නිවැරදිව බිල් කිරීම කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෛනිකව මෙට්‍රික් ටොන් 26.5 ත් 30.5ත් අතර අපද්‍රව්‍ය ප්‍රමාණයක් විවෘත අපහරණ භූමිය වෙත අවිධිමත්ව බැහැර කර තිබූ බව භෞතික පරීක්ෂණයේදී නිරීක්ෂණය විය . | අත්‍යවශ්‍ය අවස්ථා වලදී පස් යෙදීම සිදු කරන බව දන්වන අතර මදුරුවන් සහ මැස්සන් බෝවීම වැළැක්වීම සඳහා සතියකට වරක් විෂබීජහරණ කටයුතු හා ධූමායන කටයුතු සිදු කරයි. කසල බිම සහ කලපුව අතර අඩි 100ක පමණ ස්වභාවික ගස් ආවරණයක් පිහිටා ඇති බැවින් හානියක් සිදු නොවන බව. | පරිසර දූෂණය සහ මහජන සෞඛ්‍ය පිළිබඳව අවධානය යොමුකළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුමක් පිළියෙල කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා සකස් කර ඉදිරිපත් කරන බව. | රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුමක් පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව සභාව සතු ඉඩම් ලෙස හඳුනාගෙන ඇති ඉඩම් 27කට අදාලව ඔප්පු හෝ සැලසුම් හෝ නොවීය. | අදාළ ඉඩම් වලට ප්‍රකාශන ඔප්පු සැකසීමට මෙලෙස පියවර ගෙන ඇති බව. | සැලසුම් සකස් කර ඔප්පු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 වර්ෂයේ සිට පැවතෙන දේපල ණය පොලි රු.77,977 ක් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂය වන විට අය කර ගැනීමට කටයුතු කරන බව. | පොළී ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2016 වර්ෂයට පෙර සිට පැවත එන රු.61,870 ක අගරු චෙක්පත් ශේෂය හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරන බව. | අගරු චෙක්පත් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2015, 2016, 2017 හා 2020 වර්ෂවලට අදාලව කටාන ප්‍රාදේශීය ලේකම්ගෙන් ලැබිය යුතු රු.1,267,457 ක මුදල විගණිත දින වන 2023 අප්‍රේල් 24 දින වන විටත් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | අය කරගත යුතු මුදලින් රු 305,381.70.ක මුදලක් අය කරගෙන ඇති බවත් ඉතිරි මුදල ඉදිරි වර්ෂයේදී අය කර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2020 වර්ෂයේ සිට පැවත එන රු.1,677,409 ක ලැබිය යුතු අධිභාර ශේෂය අයවියයුතු පාර්ශවය හඳුනාගෙන අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | දඩ මුදල ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බව. | -එම- |
| (උ) | 2019 වර්ෂයට පෙර පැවත එන ගෙවියයුතු රු.1,008,710 ක ණය පොලී වටිනාකම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ණය පොළී නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | සභාව භාවිතා කරන මෝටර් රථයක අයිතිය 2023 අප්‍රේල් 20 විගණිත දින වන විටත් නගර සභාව වෙත පවරාගෙන නොතිබුණි. | ඉදිරි වර්ෂය තුළදී මෙම වාහනයේ අයිතිය පවරා ගැනීමට කටයුතු කරන බව. | වාහන පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (එ) | වටිනාකම රු.481,670,750 ක් වූ ගොඩනැගිලි සහ පිරියත සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ලේඛන සකස් කිරීමට පියවර ගන්නා බව. | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ඒ) | එක් මෘත දේහයක් දහනය කිරීමට වැය වන ගෑස් ප්‍රමාණය පිළිබඳ වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | එක් මෘත දේහයක් දහනය කිරීමට වැය වන ගෑස් ප්‍රමාණය පිළිබඳ වාර්තාවක් ඉදිරියේදී සකස් කර විගණනය වෙත ඉදිරිපත් කරන බව . | නිවැරදිව වාර්තා පවත්වාගෙන යා යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු ඉඩම් 03 ක් සඳහා පැවරුම් ලිපි මගින් හිමිකම් පවරා තිබුණද ඒ සඳහා ප්‍රකාශන ඔප්පු හෝ ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වනවිට රජයේ ඉඩම් අදාළ පළාත් පාලන ආයතන වෙත පවරා දීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර ඇති අතර එම වැඩසටහනට ඉඩම් 2ක් ඇතුළත් කර ඇති බවත්, ධීවර ප්‍රජා ශාලාව පිහිටි ඉඩම නිවාස සංවර්ධන අධිකාරිය මඟින් පවරන ලද ඉඩමක් බව. | ප්‍රකාශන ඔප්පු හෝ ලබාගෙන අයිතිය තහවුරු කර ගත යුතුය. |
| (ආ) | සභාව සතු අක්කර 01 පර්චස් 28.76 ක්වූ ඉඩම් 07කට අදාලව නිරවුල් හා විධිමත් වූ සැලසුම් (plan) නොතිබුණි. | අක්කර 7රූඩ් 01පර්චස් 12.25 ලෙස සඳහන්ව ඇති පිඹුරුපත යම් ව්‍යාපෘතියක් සඳහා යෝජිත පිඹුරුපතක් වන අතර ඒ සඳහා අංකයක් හෝ ලබා දී නොමැති බව. | නිරවුල් හා විධිමත් වූ සැලසුම් සකස් කළ යුතුය. |
| (ඇ) | ලියනගේමුල්ල ආදාහනාගාරය හා බණ්ඩාරවත්ත සුසාන භූමිය, කුම්භගෙය යන ගොඩනැගිලි පිළිවෙලින් රු.10,000,000 කට හා රු.2,500,000 කට තක්සේරු කර තිබුණද මෙම ගොඩනැගිලි සහිත භූමිවලට ඔප්පුවක්, සැලැස්මක් (plan) වැනි නිතිමය ලියවිලි කිසිවක් සභාව සතුව නොතිබුණි. | මේ සඳහා ප්‍රකාශන ඔප්පු සකස් කිරීම සඳහා කටයුතු කරමින් පවතින බව. | ප්‍රකාශන ඔප්පු හෝ ලබාගෙන අයිතිය තහවුරු කර ගත යුතුය. |
| (ඈ) | වටිනාකම රු.74,000,000 ක් වූ ගොඩනැගිලි 05ක් සභාවේ වත්කම් ලෙස සලකා ගිණුම්වලටද ගෙන තිබූ නමුත් එම ගොඩනැගිලි සඳහා නීත්‍යානුකූලව හිමිකම් නිරවුල් කරගෙන නොතිබුණි. | රජයේ ඉඩම් පළාත් පාලන ආයතන වලට ලබා දීමට ක්‍රියාත්මක වන වැඩපිළිවෙළ යටතට මෙම ගොඩනැගිලි 5ට අදාළ ඉඩම් අයත් වන බව. | ගොඩනැගිලි සඳහා නීත්‍යානුකූලව හිමිකම් නිරවුල් කර ගෙන අයිතිය තහවුරු කර ගත යුතුය. |
| (ඉ) | 1945 ජනවාරි 12 දිනැති අංක 9354 දරන ගැසට් නිවේදනය මගින් සභාව වෙත පවරා දී තිබූ ඉඩම් කොටසකට ප්‍රධාන කාර්යාලය, ක්‍රීඩා පිටියේ කොටසක් හා අනෙකුත් ගොඩනැගිලි කිහිපයක්ද අයත්ව තිබුණි. පසුව රූඩ් 2 පර්චස් 31.75 ක් වූ ඉඩම් කොටසක් සභාව වෙත පවරාගෙන තිබුණු අතර සකසා තිබුණු පිඹුර තුල අක්කර 07 පර්චස් 8.25 ක් ලෙස සඳහන්ව තිබුණු බව තහවුරු විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |

| | | | |
|---|---|---|---|
| I | වත්කම් ලේඛනය අනුව සභාවට අයත්ව තිබූ භූමි ප්‍රමාණය අක්කර 7 පර්චස් 23 ක් ලෙස සඳහන් කර තිබුණද අංක 4820 දරන පිඹුරුපත අනුව එම භූමි ප්‍රමාණය අක්කර 06 රූඩ් 1 පර්චස් 16.5 ක් ලෙස සඳහන් වී තිබුණු හෙයින් සභාවට අයත් භූමි ප්‍රමාණය තහවුරු කෙරෙන පිඹුරුපතක් නොවීය. | නගර සභා ඉඩමෙන් රූඩ් 01 පර්චස් 4.25 ක ප්‍රමාණයක් සභාවට අහිමි වී නොමැති බව. | සභාවට අයත් භූමි ප්‍රමාණය තහවුරු කර ගත යුතුය. |
| II | අක්කර 7 පර්චස් 8.25 ක් ලෙස පෙන්වන පිඹුරුපතෙහි බටහිර මායිමේ පර්චස් 30.5 ක ප්‍රමාණයක ලොට් අංක 2 වශයෙන් පෙන්වන නිවාස සංකීර්ණයේ ස්ථිර නිවාස සහා දේපල වශයෙන් හඳුනාගෙන නොතිබුණු අතර බාහිර පාර්ශ්වයන් 4 ක් විසින් ස්ථිර නිවාස වශයෙන් භුක්ති විඳින බව 2022 ඔක්තෝබර් 26 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය. | අදාළ කුලී නිවාස 04 සඳහා කුලී තක්සේරුවක් ලබා දීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කර ඇති බව. | අනවසර පදිංචිවීම් වැළැක්වීමට කටයුතු කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 27 දින රු.33,500,000 ක මුදලක් වැයකොට මිලට ගත් කොමට්ෂු වර්ගයේ (D 39 PX-22) ඩී 5 ඩී ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා භාවිතා කරන යන්ත්‍රය 2022 සැප්තැම්බර් 30 දින වන විටත් කිසිදු ආවරණයක් රහිතව කසල අංගනයට යාබදව ස්ථාන ගතකර තිබෙනු භෞතිකව නිරීක්ෂණය විය. | එම යන්ත්‍රය ගාල් කිරීම සඳහා ආවරණයක් සකස් කිරීමේ කටයුතු සිදු කර ඇති අතර අවසන් අදියරේ පවතින බව. | එවැනි යන්ත්‍ර ශක්‍යතා අධ්‍යයනයනයක් සිදු කර මිලට ගත යුතු අතර යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා යන්ත්‍ර ක්‍රියාකරුවකු යෙදීමට කටයුතු කළ යුතුය. |